# සිංහල සිනමාව සහ මම 3

ප්‍රේක්ෂකයකුගේ සටහනක්

චන්දන ගුණසේකර
එක්සත් රාජධානිය



මේ කාලයේ බොහෝ විශිෂ්ට ගණයේ අධ්‍යක්ෂකවරු කරලියේ පිනුම් ගසමින් සිටියෝය. ඒ අතරින් සිකුරුලියා තැනූ එච් ඩී ප්‍රේමරත්නයන් වටිනාම චරිතයකි. වාණිජ හා සම්භාව්‍ය සිනමාව නමින් සිනමාව අන්ත දෙකක ගමන් කරද්දී එතුමාගේ චිත්‍රපට මැද මාවතේ ගමන් ගති. ඒ නිසාම විචාරකයෝ එතුමාට මැද මාවතේ සිනමාකරු යන නම පටබැන්දෝය. හැමවිටම එතුමාගේ චිත්‍රපටයක ප්‍රධාන චරිතයකින් නවක නළුවකු රටට දායාද කිරීමට වග බලා ගැනීම එතුමාගේ විශේෂ ලක්ෂණයකි.

**ඒ කාලයේ සිනමා ශාලා තුළ දුම්බීමේ තහනමක් නොවූ අතර ශාලාව අඳුරු කොට චිත්‍රපටය තිරයමත දිග හැරෙද්දී ප්‍රොජෙක්ටරයේ සිට තිරය දක්වා විහිදෙන ආලෝක කදම්බය සිගරට් දුමින් ඒකාලෝක වූ ආකාරය මට දැනුදු මැවී පෙනෙයි.**



බන්දුල ගලගෙදර හා අමරසිරි කලංසූරිය එලෙස එතුමා මතු කල මැණික් වුවත් ඒවා ඔපමට්ටම් කර තව තවත් අනගි වැඩ ගන්නවා වෙනුවට ඔවුන් අයාලේ යැවීම අපගේ අවාසනාවය. සිකුරුලියා, පරිත්‍යාග, පූජා හා මංගල තෑග්ග එකල මා ආසාවෙන්ම නැරඹූ චිත්‍රපට විය. පරිත්‍යාග චිත්‍රපටයේ අයියා තම නැගනිය වෙනුවෙන් කරන කැපැවීම මට අයියා කෙනෙකු වශයෙන් විශාල ආඩම්බරයක් ගෙන දුනි. මංගල තෑග්ග කෙතරම් මනරම්ද? එහි තිබු සුනිල් එදිරිසිංහයන් ගැයූ ගීතයට සනත්,රවීන්ද්‍ර, මනෝ හා ශ්‍රියන්ත මෙන්ඩිස් රැඟු රංගනය කෙලෙසනම් අමතක කරම්ද? එම ගීතය හැම කලටම ගැලපෙන අපූරු ගීතයකි.

ඉන්පසු පූජා චිත්‍රපටයේ තම පුතාව පෝරකයේ එල්ලීමට සිදුවූ අලුගෝසුවා (ජෝ) කළ රංගනය නෙතට කඳුළක් නොගෙනාවේ කාටද? එම දර්ශනයට පසුබිමින් වාදනය වූ අමරදේවයන්ගේ පූජා ගීතය සවනට වැටෙන ඕනෑම මොහොතක චිත්‍රපටයේ රූප රාමු අප මනසේ ඇදෙන්නේ ඒ නිර්මාණවල ඇති නිර්මල විශිෂ්ට ගුණය නිසාය.

එතුමාගේ සහරාවේ සිහිනය විජයගේ අකල් වියෝව නිසා සාර්ථක නොවූ නමුත් එතුමා ඉන්පසුව නිර්මාණය කල සප්තකන්‍යා චිත්‍රපටය වාර්තා බිඳ හෙළමින් රිදී තිරය ඒකාලෝක කළාය.

සේන සමරසිංහයන් සක්විති සුවය, නිල්ල සොයා, ආශා දෑසින් හා ඈතින් ඈතට යන සිනමා පට අපට දායාද කළේය. මේ චිත්‍රපට සමුදායේ ගාමිණීගේ රංගනයන් මගේ සිත තදින්ම පැහැර ගති. ජෝතිපාලයන්ගේ හා මිල්ටන් මල්ලවාරච්චිගේ මධුර මනෝහර ගායනයන් මේ චිත්‍රපට කරා රසිකයන් ඇද බැඳ ගත්තේ පැණි හැලියට ඇදී එන්නා වූ ඇඹලයන් පරිද්දෙනි.

මේ චිත්‍රපට වල නම් කියා සේන සමරසිංහගේ ඒ චිරාගත සම්ප්‍රදාය යැයි ප්‍රචාරය කෙරුණේ එතුමාගේ චිත්‍රපට පිළිබඳ ගුවන් විදුලි ප්‍රචාරක වැඩ සටහන් වලදීයි.

ධර්මසේන පතිරාජ, වසන්ත ඔබේසේකර, කේ ඒ ඩබ්ලිව් පෙරේරා, ටයිටස් තොටවත්ත, ධර්මසිරි බංඩාරනායක, සුනිල් ආරියරත්න, ගාමිණී ෆොන්සේකා, තිස්ස අබේසේකර ඒ කලයේ වැජඹුණු අද්‍යක්ෂක වරුන් කිහිප පොළක් පමණි.

දඩයම, කරුමක්කාරයෝ, බැද්දේගම, බඹරු ඇවිත්, සරුංගලේ, ආරාධනා, සඳකඩ පහණ, සාගරයක් මැද, මලට නොඑන බඹරු, ගොළු හදවත, තුන්වැනි යාමය,මහ ගෙදර, සිරිබෝ අයියා, දෑස නිසා, එක්ටැම්ගේ,මල්දෙණියේ සිමියොං, සුද්දිලාගේ කතාව, සිරිපතුල, සොල්දාදු උන්නැහේ, මාතලං, සත්වෙනිදවස, රක්තා, මුවන් පැලැස්ස, දුලීකා, සසර චේතනා, චණ්ඩි පුතා, චණ්ඩි ස්යාමා, මගේ නංගී ස්යාමා, ටිකිරා හා රත්තරන් අම්මා වැනි චිත්‍රපට නරඹා මා ඒවායේ සැරිසැරුවෙමි. ජීවත් උනෙමි.

ඒ කාලයේ බොහෝ වාණිජ චිත්‍රපටවල තේමාව වූයේ කොල්ලා කෙල්ල ඔවුන්ගේ යහළුවන් හා දුෂ්ටයා විය. කොල්ලාට බොහෝ විට ගාමිණී ෆොන්සේකා, විජය කුමාරණතුංග, ටෝනි රණසිංහ, කලං හෝ පසුකලෙක සනත් ගුණතිලක වු අතර කෙල්ලට මාලනී ෆොන්සේකා, නදීකා, නීටා, ගීතා, ස්වර්ණා , සුමනා, ශ්‍රියානි හෝ මැණික් වැන්නි යක රඟපෑහ. මගේ කාලයට පෙර විශාල නළු නිළි සංඛ්‍යාවක් මෙම භූමිකා කළෝය. අප දන්න දා සිටම දෙනවක හාමිනේ අම්මා හෝ ආච්චීම වූවාය.
මුලදී ජෝ අබේවික්‍රම, විමල් කුමාරද කොස්තා, ජයසේකර අපෝන්සු විකට නළුවන් වූවත් පසුව විශේෂයෙන්ම ජෝ අපට නැතුවම බැරි මහා චරිතාංග නළුවකු විය. ඔහු බැද්දේගම,සිරිබෝ අයියා,මල්දෙණියේ සිමියොන්, පූජා,බඹරු ඇවිත්,සිකුරුලියා හා මෑතකදී පුරහඳ කළුවර ආදී හා මා නොකී බොහෝ චිත්‍රපටවල කල රංගනයන් කෙසේ නම් අමතක කරම්ද?

තව විකට නළුවන් වූයේ ෆෙඩී,දොන් සිරිසේන, ඇන්තනී සී පෙරේරා,බී එස් පෙරේරා, හියුගෝ මාස්ටර් වැන්නවුන්ය. එකල බංදු සමරසිංහ පොඩි කොල්ලාය.

ඩොමී ජයවර්ධන,රෙක්ස් කොඩිප්පිලි, බංදු මුණසිංහ,පියදාස ගුණසේකර,පූජිත මෙන්ඩිස්,පියදාස විජේකෝන් ,සොමී රත්නායක හා මර්වින් ජයතුංග රිදී තිරයේ දුෂ්ටයාම විය. ඇලෙක්සැන්ඩර් ප්‍රනාන්දු හා රොබින් ප්‍රනාන්දු සටන් නළුවන් වූහ.

බොහෝ චිත්‍රපටවල රාත්‍රී සමාජ ශාලාවල දර්ශන තිබූ අතර ඒවයේ නාට්‍යාංගනාව වූයේ හෙලන් කුමාරි හෝ ෆරීනා ලායි නැමැති නිලියන්ය. ඔව්හු ඒ කාරිය අකුරටම කළෝය.

එච් ආර් ජෝතිපාල, එම් එස් ප්‍රනාන්දු, මිල්ටන් මල්ලව ආරච්චි, මිල්ටන් පෙරේරා, ලතා වල්පොල, ඇන්ජලින් ගුණතිලක,සුජාතා,බෙග් මාස්ටර් හා ක්ලැරන්ස් වැනි ගායක ගායිකාවන් මගේ කාලයේ රිදී තිරය ඔවුනගේ මධුර මනෝහර ස්වරයෙන් මෙ-ෝහනය කළෝය. බෙග් මාස්ටර් ,සුනිල් එදිරිසිංහ,අමරසිරි පීරිස්,නන්දා මාලනී හා අමරදේවයන්ගේ හඬ බොහෝ විට චිත්‍රපට පසුබිම් ගායනයට යොදා ගැනුණි.

මේ කාලයේ අවුරුද්ද පුරා ඉතා අනර්ඝ චිත්‍රපට තුනක් හෝ හතරක් පිටවීමද විශේෂ කරුණකි. ඒ කෙසේ වෙතත් සිනමා ශාලා සැමවිටම වාගේ ප්‍රේක්ෂකයන්ගෙන් පිරී පැවතුණි.

බොහෝ රැකියා මාර්ගද මේ සමග බිහිවුණි. චිත්‍රපට වලට කෙළින්ම සම්බන්ධ නළු නිළියන්, කාර්මික ශිල්පීන් හැරුණු කොට සිනමා ශාලාවල කඩල විකිණූ කොලු ගැටයා පවා සිනමාවෙන් යැපුණි.

රූපවාහිනිය, සිවිල් යුද වාතාවරණය හා සිනමාවේ ප්‍රමිතිය බාලවීමත් සමගම මෙම ආදායම් මාර්ග වලටද කණ කොකා හැඬුණි. සිනමාවට සම්බන්ධව දමිළ අධ්‍යක්ෂකවරු හා කාර්මික ශිල්පීන් රාශියක් ඔවුනගේ උපරිම කැපවීම ඒ කාලයේ සිංහල සිනමාව උදෙසා යොදා තිබිණි. බොහොමයක් සිනමා ශාලා, රසායනාගාර හා ශබ්දාගාරද අයිතිව තිබුණේ දමිළ ජාතිකයන්ට වීමද විශේෂ කරුණක් වූ අතර සිනමාවේ උන්නතිය සඳහා එම ජන කොටසේ සහභාගිත්වයද එයින්ම කැපී පෙනුනී. එනමුත් ලංකාවේ අවාසනාවට ඇතිවූ ඒ ඊනියා ජාති ආලය විසින් මෙම සිනමා ශාලා ඇතුළු ශබ්දාගාර හා රසායනාගාර අලුත්ම චිත්‍රපටත් සමගම පිටපතක්වත් රහිතවම අපට අහිමි කළේ සිංහල සිනමාව වල පල්ලටම ඇද දමමිනි.

ඒ අතරම සිනමාවට නැතිවම බැරිවූ විජය මරා දැමිණි. රිචඩ් ද සොයිසා හා ප්‍රවීණ ගීත රචක ප්‍රේමකීර්ති වැන්නවුන් අපෙන් සදහටම පැහැර ගත්තේ කලාවට සහ සමස්ථයක් වශයෙන් මුලු ලංකාවටම ගැසූ අතුල් පහරක් පරිද්දෙනි. අපි මහා අවාසනාවන්තයින් වීමු.

මේ අතරම ජෝති,එම් එස්, මිල්ටන් පෙරේරා, ෂෙල්ටන් පෙරේරා,මිල්ටන් මල්ලවආරච්චි වැනි ගීත කෝකිලයින්ද ඉතාමත් අඩු වයසින් දැයෙන් සමු ගැනීමද ඒ හැත්තෑවේ දශකයේ ස්වර්ණමය යුගය තව දුරටත් නැතිවීමට රුකුලක්ම විය.

ඒ කාලයේ සිනමා ශාලා තුළ දුම්බීමේ තහනමක් නොවූ අතර ශාලාව අඳුරු කොට චිත්‍රපටය තිරයමත දිග හැරෙද්දී ප්‍රොජෙක්ටරයේ සිට තිරය දක්වා විහිදෙන ආලෝක කදම්බය සිගරට් දුමින් ඒකාලෝක වූ ආකාරය මට දැනුදු මැවී පෙනෙයි. දර්ශනය අවසන එළියට එද්දී කොන්ඩයෙන් වහනය වූ සිගරට් ගන්දස්සාරය මේ දැන් පවා නහයට දැනී යයි.ඒ අතරම සිනමා ශාලාවලටම ආවේණික සුවඳද ඒ ගැන මෙනෙහි කරද්දී නහයට දැනී යාම කෙසේවත් නොවැලක් විය හැකි කරුණකි. එය අමුතුම සුවදකි. ඒ සුවද හදේ කොනක තබා ගෙනම මේ සිනමා මතකයට සමු දෙන්නට තීරණය කළෙමි. ගාමිණී එතුමාගේ සාගරයක් මැද චිත්‍රපටය අවසනදී කිව්වාක් මෙන් මෙය "අවසානය නොවේ" තව තව ඉදිරියේදී දස දහස් ගණනින් චිත්‍රපට නිපැදේවි. අපත් වයසට යාවි. ඒත් ඒ සොඳුරු මතකයෝ තව තවත් තිරිහං වෙමින් හද තුළම රඟ දේවි.

සමුගෙන යන්නට පෙර හුදු විනෝදය පතා එකල චිත්‍රපට බලා සහ ගුවන් විදුලියෙන් අසා සිතේ කෙටුණු චිත්‍රපට දෙබස් කිහිපයක් මෙහි ලියා තබමි. ඔබට ඒ ඒ අදාළ චිත්‍රපටය ලියා තබන මෙන් ආදරයෙන් ඉල්ලමි. සැමට ජය හා සතුට

1) "ගියා නෙමේ මල්ලියේ.. ග්‍රහයා අරං ගියා.."
2) "තෝ කියන්නේ ඇත්ත නම් තොගෙ අතේ දිය පට්ට නෑ. තෝ කියන්නේ කෙප්ප නම් තොගෙ අතේ දියපට්ට. දාපං තෙල් තාච්චුවට අත"
3) "අඩෝ මහත්තයා මම හොඳින් කියන්නේ අද යන්ඩ එපා"

4) "කැලේ හිටියා කුළෙක්.. ඌ පාඩුවේ තණ කකා හිටියේ. වැදුණා ඌට වෙඩිල්ල"
5) "අපේ අම්මා මං වගේ තව එක පුතෙක් හැදුවා නම්"
6) "මල්ලී කැලේ මාරු උණාට කොටියගේ පුල්ලි මාරු වෙන්නේ නෑ"
7) "මීට වඩා හොඳයි මට වහ දුන්නා නම්"
8) "මිනිස්සු කථා හදලා. මං ගැන මමයි බතියි ගැන"

9) "පච්චේ අම්මා බුදුවේවා කියලා කොටපං"
10) "මේ අසාධාරණ ලෝකේ යුක්තිය හා සාධාරණය වෙනුවෙන් සටන් කරන මිනිහෙක් මං"

තව මෙවැනි දෙබස් ඛණ්ඩ ඔබටත් මතක නම් මට මතක් කර දෙන මෙන් ආදරයෙන් ඉල්ලා සිටිනවා. ජය

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com